

# වෙඩි හඬ අතරේ ගී මිහිර බෙදූ ශ්‍රී ලංකා ගුවන්විදුලියේ

# යාපනය සේවය

**යුද්ධය බරපතල ලෙස පැවති 1990 දශකය වන විට උතුරේ තිබූ එකම ගුවන්විදුලි මාධ්‍යය වුයේ "යාපනය සේවයයි" එය යුධ බිමෙහි උණුසුම අතරේ වුව සෙබළ හදගැස්ම මැනවින් හඳුනාගනිමින් විශිෂ්ට ජාතික මෙහෙවරකට දායක වූ ආයතනයකි. 2000 වසරේ මුල් භාගයේ යාපනය ගුවන්විදුලියේ වගතුග සොයාබලමින් එහි පාලක සිසිර කුමාර මැණික්දිවෙල මහතා සමග මා කළ සම්මුඛ සාකච්ඡාවක තතු විත්ති මෙහි අඩංගු වේ.**

**අතිශය දියුණු වත්මන් තාක්ෂණික යුගයේ සියගණනක් ගුවන්විදුලි නාලිකා සමස්ත දේශය පුරා පැතිර පැවතුනද එවක යාපනය ගුවන් විදුලිය නිහඬව කළ මෙහෙවර කිසිවකට සමකළ නොහැක.**

**යුද්ධයේ අත්දැකීම ලැබුවන් හැරෙන්නට යාපනය ගුවන්විදුලිය පිළිබඳ දන්නේ අතලොස්සකි. වත්මන් පරපුර ඒ පිළිබඳ දැනුවත් කිරීමද එවක යාපනය ගුවන්විදුලියේ කාර්යමණ්ඩලයට උපහාර පිණිසද මෙම ලිපිය යළි ගෙනහැර දක්වමි**

පරිසරය විටෙක නිසලය. විටෙක කලබලය, පාළු මූසල බවත් ගිගුම්ලන වෙඩි හඬත් අතර දෝලනය වන සොල්දාදු ජීවිත ගීතයක රිද්මයට දැහැන්ගත වන්නේ ඇසිල්ලකිනි. තම මවට, පියාට, බිරිඳට සුබපැතුමක් යවමින් පාළුව කාන්සිය මගහරවා ගන්නා සෙබළුන් දකුණේ තම ඥාතීන්ගෙන් ලැබෙන තොරතුරු සමගින් ඔවුන් හා එක්වෙති.

මෙසේ සොල්දාදුවන්ගේ ඒකාකාරී ජීවන රටාවට අස්වැසිල්ලක් ලබාදෙමින්, දැනුම විනෝදය සමගින් ඒකාත්මික කරවන යාපනය ගුවන්විදුලි සේවයේ වගතුග සොයා බැලීමට එහි මා කළ සංචාරය තුළ සටහන් කළ යුතු බොහෝ දේ තිබුණි. මන්ද යත් මුළු උතුරු ප්‍රදේශය සඳහා ඇති එකම ගුවන්විදුලි සේවාව එය වූ බැවිනි. එපමණකුදු නොව සොල්දාදුවන් අතර හදවතට කතා කළහැකි ප්‍රබලම සන්නිවේදන මාධ්‍ය ලෙසද එය ඔවුනට එතරම්ම සමීපවී ඇත්තේය.

"80 දශකය තුළ උතුරේ ගුවන්විදුලි මාධ්‍යයක් තිබුණෙ නැහැ. ඊට කලින් 1971 දී විතර මණ්ඩතිව්වල තිබුණ දෙමළ, ඉංග්‍රීසි විකාශනාගාරයෙන් තමයි උතුරට වැඩසටහන් යැව්වේ. නමුත් 1985 විතර වෙනකොට මණ්ඩතිව් විකාශනාගාරයට එල්ටීටීඊ බලපෑම් එල්ල වුණා. ඒකට හේතුව වුණේ 1983 ජූලි කලබල හා ක්‍රමයෙන් ත්‍රස්තවාදී තර්ජන වැඩිවෙනකොට ඒකේ හිටපු අය සේවයට ඒම අත්හැරියා. මේ හේතුව නිසා ගුවන් විදුලි සංස්ථාව 1985 මන්නාරමේ විකල්ප මධ්‍යස්ථානයක් ආරම්භ කළා. නමුත් ඒකත් වැඩිකල් පවත්වාගෙන යන්න බැරිවුණා. 1989 වෙනකොට නැවත එල්ටීටීඊ බලපෑම් ආවා. විශේෂයෙන්ම විකාශනාගාරයේ ජල හා විදුලි සැපයුම් මාර්ගවලට විටින් විට අලාභහානි කළා. අවසානයේදී එහි විකාශනාගාරය පවත්වාගත නොහැකි තත්වයක් උදාවුනා."




යාපනය ගුවන් විදුලියේ පාලක සිසිර කුමාර මැණික්දිවෙල මහතා



දෙමළ නිවේදක ජෝකිම් ප්‍රනාන්දු මහතා



සිංහල නිවේදක චන්දන ප්‍රේමදාස මහතා

මෙසේ මා සමග යාපනය ගුවන්විදුලි සේවයේ අතීතය ආවර්ජනය කරමින් දොඩමලු වූයේ එහි වත්මන් පාලක සිසිර කුමාර මැණික්දිවෙල මහතාය. තවදුරටත් එකී වතගොත හෙළිකරමින් කථාකළ ඔහු,

"යාපනය ගුවන්විදුලියේ දියුණුවක් ඇතිවූයේ 1990 අවුරුද්දෙ. ඒ කාලෙ ගුවන්විදුලි සංස්ථාවේ අධ්‍යක්ෂ ජෙනරාල් විදිහට පත්වෙලා ආපු හඩ්සන් සමරසිංහ මහතා යාපනයට ඇවිත් කටයුතු සොයල බලල 1990 නොවැම්බර් මාසෙදි පලාලිවල ගුවන්විදුලි FM විකාශනාගාරයෙහි විකාශන දෙකක් ඇරඹුවා. දෙමළ හා සිංහල වශයෙන්, දෙමළ සේවයේ ප්‍රධානතම අරමුණ වුනේ රජයේ හඬ උතුරට ලබාදෙන්න. විශේෂයෙන්ම සිංහල සේවය වෙන්වුනේ ආරක්ෂක හමුදා සාමාජිකයින්ට දැනුම හා විනෝදය ලබාදෙන්නයි. මට හොඳට මතකයි ඒ කාලෙ හඩ්සන් සමරසිංහ මහත්තයා මේ විකාශනාගාරය ආරම්භ කරන්න කලින් FM වර්ගයේ ගුවන්විදුලි යන්ත්‍ර 1000 ක් ගෙනත් බංකර්වල ඉන්න සොල්දාදුවන් අතරේ බෙදාහැරිය."

1993 පමණ වනවිට මේ විකාශනාගාරය සිවිල් ජනතාව අතරත් ආරක්ෂක හමුදා සාමාජිකයින් අතරත් ගොඩක් ජනප්‍රිය වුනා. වැඩසටහන් ගැන ඒ අයගෙන් සැහෙන්න ප්‍රතිචාරයක් ලැබුණා. ඒ වෙනකොට මුළු උතුරටම තිබුණ එකම ගුවන්විදුලි ප්‍රචාරක මධ්‍යස්ථානය මෙයවීම ඒ වටා මිනිස්සු රොක් වෙන්න ප්‍රධානම හේතුව වුනා. නමුත් පැවති ආරක්ෂක හේතූන් මත අපිට විකාශනාගාර පහසුකම් පුළුල් කරන්න බැරි වුනා. "රිවිරැස" මෙහෙයුමෙන් 1995 යාපනය මුදා ගත්තට පස්සෙ මේ විකාශනාගාරයේ නව පිබිදීමක් ඇතිවුනා. විශේෂයෙන්ම දෙමළ ජනතාවත්, ආරක්ෂක අංශ අතරත් මනා සම්බන්ධතාවයක් ගොඩනගන්න හැකිවුනා. මේ කාලෙදිම ඒ කියන්නේ 1995 අගභාගයේදී මේ සේවය ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ " යාපනය ප්‍රාදේශීය සේවාව" වශයෙන් නම් කළා. ඒ වනවිට තිබුණ රජරට, රුහුණු, කඳුරට හැරුනාම හතරවෙනි ප්‍රාදේශීය සේවාව වුනේ යාපනය සේවය. මේ සේවයේ ප්‍රථම පාලක වූයේ ඩෙන්සිල් විජේරත්න මහත්තයයි.

පසුව මෙම විකාශනයේ කටයුතු ව්‍යාප්ත කිරීමේ අරමුණින් විවිධ වැඩසටහන් ආරම්භ කළා. ආරක්ෂක අංශ සාමාජිකයින් වෙනුවෙන් අසන්නන්ගේ ඉල්ලීම්, අසන්නෙක් තෝරයි, දෛනික පුවත්පත් තොරතුරු, ප්‍රවෘත්ති, සුබපැතුම් වගේ වැඩසටහන් ඇතිකළා. විශේෂයෙන් මේ අතර ගොඩක් ජනප්‍රිය වූයේ "රණබිමෙන් නිවහනට, නිවහනෙන් රණබිමට" කියන වැඩසටහනයි. ඒ තුළින් දකුණේ තම ඥාතීන්ට උතුරේ යුදබිමේ සෙබළුන්ගේ පණිවුඩ යැවීමටත් උතුරේ සෙබළුන්ට දකුණේ ඥාතීන්ගේ පණිවුඩ ලබාදීමටත් අපට හැකිවුනා.

ඊට අමතරව යාපනය සේවයේ බාහිර පටිගත කිරීම් අංශය සෑම හමුදා කඳවුරකටම ගිහින් විශේෂ හැකියාවන් තිබෙන සොල්දාදුවන්ගේ කුසලතා එළිදක්වන්න "තල් සෙවනේ චාරිකාව" ආරම්භ කළා. ඒක ඔවුන් අතර ඉතාම ජනප්‍රිය වුනා. මේ තුළින් පොලිස්, නාවික, ගුවන් ආදී සෑම අංශයකම ඉන්න අයට තමන්ගෙ හැකියාවන් ඉදිරිපත් කරන්න දොරටු විවර වුනා. ඒ ඇරුනම හමුදාවල ඉන්න දක්ෂතා ඇති අය මාධ්‍යයන්ට යොමු කිරීමකුත් කළා.

දමිළ වැඩසටහන් වලටත් අපි මුල්තැනක් දුන්න. යාපනය ප්‍රදේශයේ සෑම පැත්තක්ම ආවරණය වන විදිහට ඔවුන්ගේ ජනජීවිතය, ධීවර, අධ්‍යාපන, සෞඛ්‍යය ආදී අංශ අලළා පටිගතකළ වැඩසටහන් ප්‍රචාරය කළා. ඒ කටයුතුවලදී බලාපොරොත්තු වුනාටත් වැඩිය ජනතා දායකත්වයක් අපට ලැබුනා. ඒ වැඩසටහන් කෙරෙන අතර අපි තවත් වැදගත්ම දෙයක් කළා. ඒ තමයි සිංහලෙන් දෙමළ ඉගැන්වීමත් දෙමළෙන් සිංහල ඉගැන්වීමත්, ඒක මේ දෙකොටසටම වැදගත් වුනා"

දශකයකට නොවැඩි යාපනය ගුවන්විදුලියේ අතීත මතක සටහන් එසේ අවදි කළ මැණික්දිවෙල මහතා ඔවුන් සමග උරෙනුර ගැටෙමින් එහි සේවයේ නියුතු තම සහායක නියමුවන් වන කාර්යභාර නිලධාරී අනුර ද සිල්වා සිංහල නිවේදක චන්දන ප්‍රේමදාස හා දෙමළ නිවේදක හා දෙමළ අංශය භාර ජෝකිම් ප්‍රනාන්දු යන අයද සිහිපත් කළේ ප්‍රශංසාත්මකවයි. තවද යාපනය ගුවන්විදුලිය වත්මන් තත්වයට ගෙන ඒමට විවිධ අයුරින් දායක වූ ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ සැමද කෘතවේදීව මතක් කරන බව මැණික්දිවෙල මහතා මා සමග පැවසීය. එහිදී ගුවන්විදුලි සංස්ථාවේ සභාපති ජිනදාස පීරිස් මහතාද, අධ්‍යක්ෂ ජෙනරාල් එරික් ප්‍රනාන්දු මහතාද, ප්‍රාදේශීය සේවාභාර අධ්‍යක්ෂ කොල්වින් ජයවීර මහතාද ඔහුගේ ගෞරවනීය සිහිපත් කිරීමට ඇතුළත් විය.

මේ සා විශාල කාර්යභාරයකට උරදෙමින් යාපනය ගුවන්විදුලියත් සමගින් නොසැලී කටයුතු කළ සේවක මඩුල්ලේ කැපවීම සැබැවින්ම මිලකළ නොහැකිය. යුද්ධය හමුවේ උතුර හැරගිය උතුරට පයගැසීමට පවා බියවූ සමහරුන්ට එවක යාපනය ගුවන්විදුලියේ කාර්යමණ්ඩලය කදිම ආදර්ශයක් සපයා තිබුණි.




**මේජර් සුජිත් චමින්ද එදිරිසිංහ**
මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය
යුද්ධ හමුදා මූලස්ථානය